සියලුම හිමිකම් ඇවිරුණි / All Rights Reserved]

# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
# පළමු වාර පරීක්ෂණය - 2019

**ශ්‍රේණිය : 13**

**නාට්‍ය හා රංග කලාව**
**අපරදිග නාට්‍ය කලාව II**

**කාලය පැය : 3**
**පත්‍රය : I**

**නම : - ........................................................................ අංකය............................**

- **සැලකිය යුතුයි:-**
- **I , II යනුවෙන් කොටස් දෙකකි.**
- **නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

## I කොටස

**1. ක්‍රි. පූ. 534 දී ප්‍රථම වරට ඩිතුරම්බොස් ගායන වෘන්දයට එක් වූ නළුවා සමඟ සංවාදයේ යෙදුණේ,**

i. සෙලොන් ය ii. අරියොන් ය iii. තෙස්පිස් ය
iv. පෙරියන්ඩර් ය v. මෙනෙන්ඩ්‍රොස් ය

**2. ග්‍රීක නාට්‍යයට දෙවන නළුවකු එක්කිරීමේ ගෞරවය හිමි වන්නේ,**

i. ඊස්කිලස් ය ii. සෙනෝක්ලිස් ය iii. යුරිපීඩීස් ය
iv. ඇරිස්ටොෆානිස් ය v. මෙනෙන්ඩ්‍රොස් ය


**3. ගායන වෘන්දය විසිහතර දෙනෙකුගෙන් සමන්විත නාට්‍යකරු වනුයේ,**

i. පුටිනස් ය ii. ඊස්කිලස් ය iii. මිනැන්ඩර් ය
iv. සොෆොක්ලිස් ය v. ඩොයිරිලොස් ය

**4. යුරිපීඩිස් විසින් රචිත ට්‍රැජඩි නාට්‍යයක් වන්නේ,**

i. ඉලෙක්ට්‍රා ii. ඇග්මෙනෝන් iii. ලයිසිස්ට්‍රා
iv. වළාකුළු v. මීඩියා

- **පහත දැක්වෙන රූප සටහන ආශ්‍රයෙන් 5 හා 6 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



**5. ඉහත රූප සටහනේ දැක්වෙනරංග ශාලාව පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,**

i. ක්‍රි. ව. 1599 දී ඉදි කරන ලද ග්ලෝබ් රඟහලෙහි ප්‍රථම වතාවට රඟදැක්වන ලද්දේ ජුලියස් සීසර් නාට්‍යයකි.

ii. මෙය ප්‍රේක්ෂකයන් 2000 කට පමණ ඉඩ පහසුකම් ඇති වෘත්තාකාර තෙමහල් ගොඩනැගිල්ලකි.

iii. මෙම වේදිකාව ප්‍රධාන කොටස් 4 කින් සමන්විතය

iv. මෙම වේදිකාවේ මුලින්ම රඟදැක්වන ලද්දේ ඔතෙලෝ නාට්‍යයයි

v. ක්‍රිස්ටෝපර් මාලෝගේ ''ඩොක්ටර් ෆවුස්ටස්'' මුලින්ම රඟදැක්වන ලදි.

**6. මෙහි A අක්ෂරයෙන් දැක්වෙනුයේ,**

i. ස්වර්ගය　　ii. උපරි වේදිකාව　　iii. උමං දොරටු

iv. ප්‍රධාන වේදිකාව　　v. අභ්‍යන්තර වේදිකාව

**7. ග්‍රීක නාට්‍ය සම්ප්‍රදාය සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,**

i. සියලු චරිත රඟපාන ලද්දේ පිරිමින් විසින්ය

ii. ග්‍රීක ට්‍රැජඩි නාට්‍යයේ රංග ශෛලිය ලෝකධර්මීය

iii. සෑම පිරිමියෙක්ම වෙස් මුහුණු පැළඳ රංගනයේ යෙදිණි.

iv. නර්තන විලාසයක් හා සංගීත සංයෝජන දක්නට ලැබිණි

v. ''එකුක්ලීමා'' යන්ත්‍රය මගින් මළ සිරුරු වේදිකාවට ගෙන්වන ලදි

**8. ඊඩිපස් රජ නාට්‍යයේ වේදිකාවක් මත ඉදිරිපත් නොකල අවස්ථාවක් නොවනුයේ,**

i. ළදරු 'ඊඩිපස්' කුමරුගේ දෙපා සිදුරු කොට විලංගු දැමීම

ii. කොරින්ත වැසියාගේ ඝාතනය

iii. ජොකොස්ටා බිසව ගෙළ වළලා ගෙන මිය යාම

iv. තෙරේසියාස් අන්ධ පූජකයාගේ පැමිණීම

v. ඊඩිපස් විසන් දෙනෙත් අඳ කර ගැනීම

**9. පශ්චාද් දෘෂ්ටි කථන රීතිය භාවිත කළ නාට්‍ය දෙකක් වනුයේ,**

i. ඩෝල්ස් හවුස් හා ඇන්ටිගනී

ii. වනතාරාවී හා හුණුවටය

iii. කුවේණි හා මාස්ටර් බිල්ඩර්

iv. ඊඩිපස් හා ඩෝල්ස් හවුස්

v. හරිම බඩු හයක් හා ඩෝල්ස් හවුස්

**10. මිනිසකුගේ සදාචාරය පිළිබඳ සාකච්ඡා කරන නාට්‍ය සම්ප්‍රදාය,**

i. මිස්ටරි　　ii. මිරකල්　　iii. මොරැලිටි

iv. පසන්　　v. තිර්ලානා

**11. ශේක්ෂ්පියර් සමකාලීන නාට්‍ය කරුවෙක් නොවනුයේ,**

i. එඩ්වර්ඩ් ඔල්මි ii. ජොන් ලයිලි iii. බෙන් ජොන්සන්
iv. තෝමස් කීඩ් v. රොබට් ග්‍රීන්

**12. ශේක්ෂ්පියර් රචනා කළ නාට්‍ය අයත් වර්ගයක් නොවන්නේ,**

i. ඛේදාත්ම නාට්‍ය ii. ආවේගාත්ම නාට්‍ය iii. සුඛාත්ම නාට්‍ය
iv. කුණාටු නාට්‍ය v. ඉතිහාස නාට්‍ය

**13. ඛේදාත්ම නාට්‍යයක් වන්නේ,**

i. ලවුස් ලේබර්ස් ලොස්ට්
ii. ඇන්ටනි හා ක්ලියෝපැට්රා
iii. මර්චන්ට් ඔෆ් වෙනිස්
iv. ඇස්. යූ. ලයික් ඉට්
v. ගිං ජෝන්

**14. ජුලියර්ස් සීසර් නාට්‍ය රචිත වර්ෂය,**

i. ක්‍රි. ව. 1594 ii. ක්‍රි. ව. 1601 iii. ක්‍රි. ව. 1604
iv. ක්‍රි. ව. 1606 v. ක්‍රි. ව. 1608

**15. ජුලියස් සීසර් නාට්‍යයේ එන චරිතයක් නොවන්නේ,**

i. කැල්ෆර්නියා ii. පෝෂියා iii. මාක් ඇන්ටනි
iv. ඩෙස්ඩිමෝනා v. බ්රූටස්

**16. ''ඕ ජුලියස් සීසර් ඔබ තාමත් ශක්තිමත්'' මෙම ප්‍රකාශය කරන ලද්දේ,**

i. බ්රූටස් ii. මාක් ඇන්ටනි iii. කැසියස්
iv. ඔක්ටේවියස් v. කස්කා

**17. ''බ්රූටස් උඹත් එහෙනම් සීසර් වැටුණාදෙන්'' මෙම ප්‍රකාශය කරන ලද්දේ,**

i. බ්රූටස් ii. මාක් ඇන්ටනි iii. කැඩියස්
iv. ඔක්ටේවියස් v. සීසර්

**18. ''මා සීසර්ට අනාදරයක් දක්වූවා නොවෙයි එහෙත් මා වඩාත් ආදරය කළේ රෝමයටයි''**

i. කැසියස් ii. මාක් ඇන්ටනි iii. බ්රූටස්
iv. කස්කා v. ඩින්නා

**19. 20 වන සියවසේ නාට්‍යකරුවකු වන්නේ,**

i. ඇලෙක්සැන්ඩර් ඩූමා ii. බර්ටොල් බ්‍රෙෂ්ට් iii. යෙව්හිනි ෂ්වාර්ට්ස්

iv. එමිල් සෝලා v. හෙන්රි බෙක්

**20. ''මම උත්සාහ කරනවා මමද නැත්නම් සමාජ රටාවද හරි කියා ඒක නිවැරදිව තෝරා බේරා ගන්න'' මෙය ප්‍රකාශ කලේ,**

i. හෙල්මර් ii. නෝරා iii. ලින්ඩෙ

iv. ක්‍රොග්ස්ටඩ් v. දොස්තර රන්ක්

**21. හේන්රික් ඉබ්සන් රචනාකළ නාට්‍ය පමණක් අඩංගු ගොනුව තෝරන්න.**

i. වන තාරාවා, සමාජයේ කුළුණු, ජන හතුරා

ii. ගොඩෝ එනකං , හිරු දහසක්, අවතාර

iii. මිස් ජුලී, සමාජ කුලුණු, වේරිවත්ත

iv. වෙරිවත්ත, මකරා, රොස්මරෝස්

v. අවතාර, ගොඩෝ එනකං, මිස් ජුලී

**22. යථාර්ථවාදී නාට්‍යකරුවකු නොවන්නේ,**

i. ඇන්ටන් චෙකෝෆ් ii. බර්නාඩ් ෂෝ

iii. මැක්සිම් ගෝර්කි iv. හේන්රික් ඉබ්සන්

v. අන්ද්‍රෙ අන්තොයින්

**23. රූපණය සම්බන්ධ වැරදි ප්‍රකාශයක් වන්නේ,**

i. කොන්ස්ටාන්ටින් ස්ටාස්ලව්ස්කි ''නව රූප විධි ක්‍රමය'' (Methocl Acting) හඳුන්වා දෙන ලදී.

ii. ස්ටැනිස්ලවස්කි ''නළුවකුගේ පෙරහුරුව'' කෘතිය රචනා කරයි.

iii. අභූත රූපි රංගනයේදී නළුවා අභියෝගයෙන් අධිතාත්විකවාදී විකට රූප මෙන් භූමිකා නිරූපණය කරයි.

iv. බර්ටොල් බ්‍රෙෂ්ට් රූපණයේදී නළුවාගේ ආවේශය පිටු දකිමින් නළුවා යම්කිසි චරිතයක් ගෙනහැර දක්වන්නෙකු ලෙස රූපණයේ යෙදිය යුතු අයුරු දක්වයි.

v. අඛ්‍යාන රංගනයේදී නළුවා චරිතයට අවේශ වී රංගනය කරයි.

**24. අසම්මත නාට්‍ය කරුවකු නොවන්නේ,**

i. ඉයුජින් අයනෙස්කෝ ii. එඩ්වඩ් ඔල්බී iii. හැරල් පින්ටර්

iv. බර්නාඩ් ෂෝ v. සැමුවෙල් බෙකට්

- **පහත ඡායාරූප ආශ්‍රයෙන් 25 - 28 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. නිවැරදි අක්ෂරය / අක්ෂර තෝරා වරහන තුළ ලියන්න.**

**ක** **ග** **ච**



25. ආඛ්‍යාන රංග රීතිය හඳුන්වා දුන්නේ ( )
26. ''චෙරිවත්ත'' නාට්‍ය රචනා කළේ ( )
27. ඩෝල්ස් හවුස් නාට්‍ය රචනා කළේ ( )
28. යථාර්ථවාදී රංගරීතියට අයත් නාට්‍යකරුවන් වනුයේ ( )

- **පහත i . ii. iii යටතේ සංවාද කීපයක්ද, ලෙස නාට්‍ය කිහිපයක නම් ද දක්වා ඇත.**

i. ''තොප වේ මේ බිමේ ශාපය. තො වේ මේ බිමේ කිලුටා''

ii. ''මේ ඔයයි මායි දෙන්නම ගැලවිලා මේ බලන්න මාගේ අත්සන තිබුණා ණය ගිවිසුම් කඩදාසිය ආපසු එවලා''

iii. සිංහ ධේනුවක් පැටවු වදල තිබුණලු. මහපාර මැද මිනි වළවල කට ඇරිල මළ මිණී එළියට ආවලු''

A ඊඩිපස් B ජුලියස් සීසර් C ඩොල්ස් හවුස්

**29. ඉහත** i . ii. iii අන්තර්ගත නාට්‍ය අනුපිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.

i. ACB ii. ABC iii. CBA iv. BAC v. BCA

**30. 29 වන ප්‍රශ්නයට අදාළ නාට්‍ය තුන නාට්‍ය විකාශයේ කාලානුරූපව පෙළ ගැස්වූ විට,**

i. ABC ii. ACB iii. CBA iv. BAC v. BCA

**31. කතා වින්‍යාසය සම්බන්ධ නිවැරදි ප්‍රකාශයක් නොවන්නේ,**

i. සරල හා සංකීර්ණ වශයෙන් දෙයාකාරය

ii. සංකීර්ණ හා කථා වස්තුව ප්‍රත්‍යාවතය හා ප්‍රත්‍යාවර්තනය යුතුය.

iii. ශෝකෝත්පාදයේ සය වැදැරුම්අංග අතර ප්‍රමුඛස්ථානය ගනී.

iv. සරල කතා වස්තුව සිද්ධිවල සංකීර්ණත්වයෙන් ඉරණම් පෙරළිය සිදුවේ.

v. ප්‍රත්‍යාවර්ථනය යනු ඛේදනීය වීරයාගේ භාග්‍ය පරිවර්තනයේ සිදුවන අවස්ථාවයි

**32. වේදිකා නාට්‍ය සංගීතය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.**

i. සංගීතය නොමැති වේදිකා නාට්‍යයක් නැත.

ii. කැළණි පාලම සංගීතය භාවිත නොකළ සාර්ථක නාට්‍යයකි

iii. සංගීතය ආහාර්ය අභිනයට අයත් නොවේ

iv. සංගීතය රංගපරම නොවිය යුතුය

v. ට්‍රැජඩි ජන නාට්‍යයේ සංගීතය සයවැදෑරුම් අංගවලට අයත් නොවේ

**33. ගඟනිකාව ආලෝකමත් කිරීමට හා වේදිකාවේ සුදුපැහැති ද්‍රව්‍ය දෘෂ්‍යමාන කිරීමට භාවිත කළ රංගාලෝක පහන් පිළිවෙළින්,**

i. යොමු පහන හා ධාරාලෝක පහන

ii. ආලේක බුබුළු වැට හා අල්ට්‍රා වයලට් පහන

iii. අල්ට්‍රාවයලට් පහන හා ප්‍රයෝග ප්‍රක්ෂේපණ දර්ශකය

iv. තිත් පහන හා කලර් වීල්

v. අල්ට්‍රාවයලට් පහන හා සෙවනැලි නිර්මිත පහන

**34. වේදිකා පසුතල සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.**

i. නාට්‍යධර්මී ශෛලිදී පසුතල අවශ්‍ය නොවේ

ii. මනමේ නාට්‍ය පසුතල භාවිත කරයි

iii. රුකඩ ගෙදර නාට්‍යයේ කිසිදු පසුතලයක් නැත

iv. ත්‍රිමාණ පසුතල භාවිතයට ආවේ තත්වානුරූපී මායාව නිරූපණය

v. මිනිස් සිරුරු භාවිතයෙන් ද පසුතල නිර්මාණය කරයි.

**35. අධ්‍යක්ෂණය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.**

i. ග්‍රීක හා රෝම නාට්‍ය සඳහා වෙනම ම අධ්‍යක්ෂකවරයෙක් සිටියේ ය

ii. ෂේක්ෂ්පියර් නාට්‍ය වලද සංස්කෘත නාට්‍යවල වෙනම ම අධ්‍යක්ෂකවරයෙක් සිටියේ ය

iii. සංස්කෘත නාට්‍ය සම්ප්‍රදායන්හි අධ්‍යක්ෂ භූමිකාව සූත්‍රධර නම් වූ වෘත්තීය ශිල්පියෙකු වෙත පැවරිණි.

iv. නූතන අධ්‍යක්ෂ භූමිකාව හමුවන්නේ 21 වන සියවසේදි ය

v. ෂේක්ෂ්පියර්ගේ යුගයේ සිටි නාට්‍ය අධ්‍යක්ෂවරයෙකි තෝමස් කිඩ්

- **පහත දී ඇති වගුව ආශ්‍රයෙන් 36 - 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | |
|---|---|---|
| **A ඇගමෙනොන්** | **F දෙබරු** | **K අල්තාරය** |
| **B පැරඩොස්** | **G බොයිපොයිරොයි** | **L නත්තල් ගස** |
| **C කුරුල්ලෝ** | **H මැකරුන්** | **M මාර්තා ග්‍රැහැම්** |
| **D තරන්තලා නැටුම** | **I රොබට් ඩී. නීරෝ** | **N එව්මිනිඩස්** |
| **E මාලන් බ්‍රැන්ඩෝ** | **J ස්කිනය** | **O වළාකුළු** |

**36. ඊස්කිලස්ගේ ඔරෙස්ට්‍රියා ත්‍රිකය වනුයේ,**

i. AGN ii. AFK iii. BGK iv. CFK v. AFK

**37. ග්‍රීක රංග භූමිය හා සම්බන්ධ වනුයේ,**

i. BFL ii. BJK iii. BJO iv. JEC v. BIK

**38. ග්‍රීක කොමඩි නාට්‍ය වනුයේ,**

i. CGN ii. AGO iii. CFO iv. CGN v. AFO

**39. යථාර්ථවාදී නාට්‍යයක් හා සම්බන්ධ වනුයේ,**

i. CHL ii. AHO iii. CFO iv. DHL v. DJL

**40. රූපණ ශිල්පය හා සම්බන්ධ වනුයේ,**

i. EIM ii. EGN iii. AGM iv. AGN v. EGM

II කොටස

- **A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

**A කොටස**

1. i. ග්‍රීක රඟ මඬලෙහි කොටස් නම් කරන්න.
   ii. ග්‍රීක රංග භූමිය ග්‍රීක ශෛලියට අනුග්‍රහවූවකි. ශෛලියට අනුව යොදාගත් සුවිශේෂී රංග උපක්‍රම දක්වන්න.
   iii. ග්‍රීක ගායන වෘන්දය මගින් ඉටුකර ගැනීමට අපේක්ෂිත කාර්යයන් නිර්දිෂ්ට පෙළ ඇසුරින් දක්වන්න.

2. i. ට්‍රැජඩියක කතා නායකයාගේ ලක්ෂණ කවාර්ද?
   ii. කොමඩියේ සුවිශේෂ ලක්ෂණ කවරේද?
   iii. කොමඩි නාට්‍යයක් පිළිබඳව විමර්ශනයක් කරන්න.

3. i. ශේක්ෂ්පියර් තම නාට්‍ය නිර්මාණ සඳහා යොදාගත් මූලාශ්‍ර නම් කරන්න.
   ii. එළිසබතීන නාට්‍ය කලාවේ දක්නට ලැබෙන පොදු ලක්ෂණ 4 ක් සැකෙවින් පැහැදිලි කරන්න.
   iii. ජුලියර්ස් සීසර් නාට්‍යය ඇසුරින් උක්ත ලක්ෂණ පැහැදිලි කරන්න.

**B කොටස**

4. i. ජුලියර්ස් සීසර් නාට්‍යයෙන් මතුවන තේමා දෙකක් නම් කරන්න.
   ii. බ්‍රූටස් ඇතුළු පිරිස සීසර්ට එරෙහි වීමට හේතු වූ කරුණු කවරේද? කරුණු දෙකක් පැහැදිලි කරන්න.
   iii. සීසර් ඝාතකයන්ට එරෙහිව ක්‍රියා කිරීමට මාක් ඇන්ටනී ක්‍රියාකළ අයුරු නාට්‍ය පෙළ ඇසුරින් පැහැදලි කරන්න.

5. i. ඔබ දන්නා රංග රීතින් 4 ක් නම් කරන්න.
   ii. ඇරිස්ටෝටලියානු රංග සිද්ධාන්තයට ප්‍රතිවිරුද්ධ වූ රංග රීතියක් නම් කොට ඒ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.
   iii. ඉහත රංග රීතියෙහි දක්නට ලැබෙන මූලික ලක්ෂණ ඔබ කැමති නාට්‍යයක් මගින් නිදසුන් සපයමින් පැහැදිලි කරන්න.

6. i. රූකඩ ගෙදර නාට්‍ය තුළින් හෙළිවන කාන්තාව පිළිබඳ දැක්වෙන අදහස් දෙකක් දක්වන්න.
   ii. හෙල්ම නුවුරා යන චරිතද්වයෙහි දක්නට ලැබෙන ගැටුම්කාරි තත්ත්වයට හේතු වූ කරුණු දෙකක් හෙල්මර්ගේ චරිතය ඇසුරින් පැහැදිලි කරන්න.
   iii. කුටුම්භයේ යහ පැවැත්ම උදෙසා ගත යුතු වූ ක්‍රියාමාර්ග රූකඩ ගෙදර නාට්‍ය පෙළ ඇසුරින් විමසන්න.

**II පත්‍රය නාට්‍ය හා රංග කලාව II අපරදිග නාට්‍ය කාලව**

**පිළිතුරු පත්‍රය**

1. i. ග්‍රීක රඟ මඩලේ කොටස්
   ප්‍රේක්ෂාලය (තෙයට්‍රොන්) , ඕර්කිස්ට්‍රා , පැරඩෝස් , ප්‍රොසීනියම් , පැරසීනියම්
   ස්කීන ගොඩනැගිල්ල (ලකුණු 04)

   ii. නළුවන් වෙස් මුහුණු භාවිතය (හඬ විහිදුණු ලෙස සැකසුණු)
   අඩි උස පාවහන් පැළඳීම
   දිගු ලෝගු හා පිම්බුණු ඇඳුම් භාවිතය
   වාචික අභිනය ප්‍රධාන කොට ගැනිම
   එකුක්ලීමා , දොඹකර වැනි යන්ත්‍රෝපකරණ භාවිතය තුළින් චරිත ප්‍රවේශ කිරීම
   පැරඩෝසය ගායක වෘන්දයේ රංග කාර්ය සඳහා යොදා ගැනීම
   ස්කීනය රජ මාලිගාව ලෙස භාවිත කරමින් රජ මැදුර තුළ දර්ශන සඳහා ස්කීයේ
   දොරටු යොදා ගැනීම
   ලේ තැවරුණු දර්ශන ස්කීනය තුළ සිදුවන ලෙස නිරූපණය කිරීම. (ලකුණු 05)

   iii.නාට්‍යයට පාදක වන ප්‍රධාන නගරවාසීන් නියෝජනය කිරීම
   චරිත ලෙසින් පෙනී සිටීම
   චින්ත්‍යාභයන්තරික සිතුවිලි හෙළි කිරීම
   චරිතයට අවවාද කිරීම
   වේදිකාවේ නොපෙන්වන දේ පණිවුඩකරුවකු මගින් හෙළි කිරීම
   යනාදි කරුණු නිර්දිෂ්ට පෙළ ඇසුරින් නිදසුන් මගින් පැහැදිළි කිරීම. ලකුණු 06

2. i. ට්‍රැජඩියක කථා නායකයා සතුවිය යුතු ලක්ෂණ 02 ක්
   රජකු හෝ ප්‍රභූවරයකු වීම
   දූනුවත්ව පාපී ක්‍රියාවක නිරත නොවීම
   මධ්‍යස්ථ පුද්ගලයකු වීම
   නාට්‍යාවසානයේ ඛේදජනක ඉරණමකට ලක්වීම. ලකුණු 04

   ii. විනෝදාස්වාදය පරමාර්ථ කොට ගැනීම
   ප්‍රීතිමත් හා හාස්‍යජනක අවසානයක් තිබීම
   සමාජයේ දුර්වල තැන් සමකාලීන පුද්ගලයෝ හෝ දේශපාලඥයන් විවේචනයට ලක්
   කිරීම.
   කථා නායිකාවන් සාමාන්‍ය පුද්ගලයින් වන අතර දුර්ගුණවලින් යුක්තවීම
   නාට්‍යමය භාෂාවෙන් රචනාවූවත් භාෂා විලාසය ව්‍යවහාර බසවීම

අසභ්‍යත්වය හා ග්‍රාම්‍යත්වය උත්පාදන ශක්තියට හේතු වේ, යැයි විශ්වාසයෙන් ලිංගික ක්‍රියා අනුකරණය.

යනාදි කරුණු 05 ක් වත් දැක්වීම. ලකුණු 05

iii. ඇරිස්ටොෆනීස්ගේ කොමඩි නාට්‍යයකින් දක්වා ඇති කරුණු අනුව ලකුණු පිරිනමන්න. ලකුණු 06

3. i. ඓතිහාසික කථා - පුරාණවෘත්ති
වංශ කථා - ජනප්‍රවාද

ii. අංකවලට හා දර්ශනවලට බෙදා තිබීම
වේදිකා පසුතලයක් භාවිත නොකිරීම
සමාජයේ සෑම චරිතයක්ම අන්තර්ගතවන සේ චරිත නිර්මාණය
කාව්‍යමය භාෂාව
අද්භූත සිදුවීම් බහුලවීම
ප්‍රභූ ප්‍රධාන චරිතය වීම සහ ඔවුන්ගේ ඛේදනීය අවසානය
සර්වකාලීන තේමා තිබීම
යනාදි ලක්ෂණ 05 ක් සැකෙවින් දැක්වීම. ලකුණු 05
කරුණු පමණක් නම් කිරීම ලකුණු 2 1/2

iii. ජුලියස් සීසර් නාට්‍යයේ ඉහත ලක්ෂණ පැහැදිලි කිරීම. ලකුණු 06
(පෙළින් නිදසුන් දක්වා තිබිය යුතුය)

4. i. බලකාමීත්වය
උන්නතිකාමය (විජිගීෂාව)
ඝාතනය සහ පළිගැනීම
බලයට එරෙහි බලය
උතුම් පරමාර්ථ වෙනුවෙන් ලේ ගැලීම
බුද්ධි හා හැඟීම් අතර අරගලය
මෙවැනි පිළිගත හැකි තේමාවන් ලියා ඇති විටද ලකුණු පිරිනමන්න. ලකුණු 04

ii. බ්‍රූටස් ඇතුළු පිරිස සීසර්ට එරෙහි වීමට හේතු වූ කරුණු,
සීසර් ඒකාධිපතියෙකු යැයි සිතීම
සීසර්ගෙන් රෝම අධිරාජ්‍ය බේරා ගැනීම
සීසර් තම තීරණ පිළිබඳ දැඩි ස්ථාවරයක සිටීම
තමන්ට යහපත් හා නිවැරදි යැයි සිතන අරමුණු ඉටුකර ගැනීම. ලකුණු 05
කරුණු 03 නම් කිරීම - ලකුණු 02 - පැහැදිලි කිරීම - ලකුණු 05

iii.මාක් ඇන්ටනී අවමඟුල් දේශනය උපයෝගී කර ගනිමින් ජනතා හැඟීම් අවධි කරමින් සීසර් ඝාතකයන්ට එරෙහි වූ ආකාරය පෙළ ඇසුරෙන් පැහැදිලි කළ යුතුය.

ලකුණු 06

5. i. සංකේතවාදී රංග රීතිය
ප්‍රකාශනවාදී රංග රීතිය
ආඛ්‍යාන රංග රීතිය
අසම්මත රංග රීතිය
යථාර්ථවාදී රංග රීතිය
යනාදි රංග රීති නම් කිරීම. ලකුණු 04

ii. ආඛ්‍යාන රංග රීතිය දක්වා කෙටියෙන් පැහැදළි කිරීම. ලකුණු 05

iii.නාට්‍යමය ඒකත්වය
කතා වින්‍යාසය
චරිතයට ආවේශ වීම
යන කරුණු ඇසරින් මූලික ලක්ෂණ බ්‍රෙෂ්ට්ගේ නාට්‍ය කෘතියක් ඇසුරින් පැහැදිලි කළ යුතුය.
කරුණු නම් කිරීම ලකුණු 03
නිදසුන් සමඟ පැහැදිලි කිරිම ලකුණු 06

6. i. පුරුෂාධිපත්‍යයට කාන්තාව නතුවිය යුතු වීම
බිරිඳකගේ කාර්ය දරුවන් රැකබලා ගැනීම පමණක් වීම
තීන්දු තීරණ ගැනීමේ අයිතිය කාන්තාව සතු නොවීම

ii. හෙල්මර්ගේ ආත්මාර්ථකාමීබව, ගර්වය, පටු ආකල්ප, ගතානුගතිකත්වය යනාදිය කරුණු ගැටුම්කාරී තත්ත්වයට හේතු වූ ආකාරය පැහැදිලි කිරීම

iii.ස්වාමියා හා බිරිඳ අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුතුව ක්‍රියා කිරීම
එකිනෙකා කෙරෙහි විශ්වාසයෙන් ක්‍රියා කිරිම
වගකීම් බෙදා හදාගෙන කටයුතු කිරීම
ස්වාමියාට මෙන්ම බිරිඳටද තීරණ ගැනීමේ අයිතිය පිලිගැනීම
සාකච්ඡා මාර්ගයෙන් ගැටළු විසඳ ගැනීම
යනාදි පිළිගත හැකි කරුණු පෙළද ඇසුරු කොට ගනිමින් පැහැදිලි කිරීම. ලකුණු 06